The Journal of Archaeology and Heritage Studies (JAHS) 8 (I) 2021: 01 - 10

The Journal of
Archaeology & Heritage Studies
Journal Home page

Research Paper

# Archaeological and Architectural Monuments Depicted on Sri Lankan Currency Notes (From 1951 to 2013 currency notes series issued by the Central Bank of Sri Lanka)

**Upeksha Gamage**[1*], **Harshani Pathmakulasooriya**[2].

1. Senior Lecturer, Department of History & Archaeology, University of Ruhuna (*Corresponding Author) upeksha_gamage@yahoo.com
2. Postgraduate Student, Postgraduate Institute of Archaeology, University of Kelaniya

ABSTRACT

Currency circulated in the world's economic systems take the forms of coins and paper notes. Compared to the coins, paper notes lack any tangible value, but they carry the monetary value of the denoted amount on the surface of the note. Currency notes has the prominent role of keeping the flow of the liquidized money in a given state. Every state of the world print money for this purpose, but the state's utilization of these notes goes beyond that. Currency notes are utilized as tools to communicate social, cultural, and political messages of a state. This paper aims to identify the Sri Lankan archaeological and architectural monuments depicted in currency notes and to describe reasons for depicting them on currency notes. Paper notes printed by the Central Bank on various themes up to 2018 have archaeological and architectural monuments in majority of them. In the field survey that formed the basis for this study, each currency note available at the Central Bank of Sri Lanka museum and the Matara Branch Museum were studied. Also studied literature and other sources on currency notes. Archaeologically and architecturally significant and popular monuments are one of the most portrayed pictures in currency notes in Sri Lanka, and these are incidentally also the ones that symbolizes ideas of nationhood, prosperity, and economic development in Sri Lankan culture. As past prosperity, economic development, and national pride are themes that deeply resonates with the Sri Lankan society, the use of these selected vestiges of past glory is a clear way of stimulating the people and to project the economic growth and national pride at the same time. Another motivation is recording this heritage and showcasing it so the world can see.

ARTICLE INFO

*Article History:*
Received 31 December 2022
Accepted 31 May 2023
Available online 01 October 2023

**Key words:** Archaeological heritage, Architecture monuments, Art and Crafts, Currency, Currency notes,

## ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටුවල නිරූපිත පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති

**(1951 සිට 2013 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මුදල් නෝට්ටු කාණ්ඩ ඇසුරින්)**

## 1. හැඳින්වීම

භාණ්ඩ හුවමාරුව ඔස්සේ අතීතයේ සිට ගනුදෙනුවල නිරත වූ මානවයා සංස්කෘතික පරිණාමයත් සමග විවිධ වස්තූන්ට වටිනාකම් ආරෝපනය කිරීමට පෙළඹුනි (Weatherford, 1997, pp 20-22). එහි දීර්ඝකාලීන ප්‍රතිඵලයක් ලෙස මුදල නමැති වටිනාකම් ඒකකය සමාජගත විය (Silva, 2000, pp. 11-14). මුදල් යනු නිල ප්‍රකාශනය සහ ප්‍රචාරනය සඳහා මිලියන ගණන් මිනිසුන් විසින් සාමාන්‍යයෙන් භාවිත කරන හා නිසැකවම පිළිගත් බලවත් හා විශ්වාසදායී ආධාර ද්‍රව්‍යයකි (ක්‍රව්දර්, 1965, පි. 3). ලෝකයේ සංසරණය වන විනිමය නැතහොත් මුදල් මාධ්‍යය කාසි සහ නෝට්ටු වශයෙන් දෙයාකාර වේ.

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට (The Oxford English Dictionary, 1989, p. 165) අනුව මුදල් නෝට්ටු යනු නිශ්චිත වටිනාකම් ඒකකයක් සටහන් කරන ලද යම්කිසි අධිකාරියක් මඟින් නීත්‍යානුකූලව පිළිගත් කඩදාසි කැබැල්ලකි. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ මුදල් නෝට්ටුව අර්ථ දක්වා ඇත්තේ මුදල් සඳහා ව්‍යවහාර කරන කඩදාසි කොළය යනුවෙනි



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

(ශබ්දකෝෂය, 1963, පි. 782). රජය හෝ මහ බැංකුව විසින් නීත්‍යානුකුල ටෙන්ඩරයක් ලෙස නිකුත් කරන ලද සහ ආදේශකයක් ලෙස සංසරණය වන කඩදාසි, මුදල් නෝට්ටු ලෙස සලකනු ලබන බව කොලින්ස් ශබ්දකෝෂයේ (Collins Dictionary, 2020) දක්වා ඇත. බ්‍රිටැනිකා විශ්වකෝෂය (The New Encyclopedia Britannica, 2005, p. 438) මුදල් නෝට්ටු යනු ආර්ථිකයක් තුළ භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීම සඳහා කඩදාසි මත මුද්‍රණය කර ඇති මාධ්‍යයක් ලෙස අර්ථ දක්වා ඇත. කේම්බ්‍රිජ් ශබ්දකෝෂයේ (Cambridge Dictionary, 2020) මුදල් නෝට්ටු අර්ථ නිරූපනය කර ඇත්තේ භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම සඳහා භාවිත කරන විශේෂ කඩදාසි යනුවෙනි. වෙබ්ස්ටර් ශබ්දකෝෂය (Webster Dictionary) මුදල් නෝට්ටු පිළිබඳ අර්ථ දක්වා ඇත්තේ රජයේ අධිකාරියක් විසින් මුදල් ලෙස නිකුත් කරන රජයේ නෝට්ටු යනුවෙනි. මුදල් නෝට්ටු යනු රටක මුදල් ප්‍රතිපත්තියට අනුකූලව අරමුදල් ගලායාම පවත්වා ගැනීම සඳහා නිල වශයෙන් භාවිත වන කඩදාසි මුදල් වන අතර එය භාණ්ඩ හා සේවා ගනුදෙනු සඳහා සංසරණය වේ (Investopedia, 2020).

කාසි සමඟ සන්සන්දනාත්මකව බලන කළ කඩදාසි සඳහා සැළකිය යුතු භෞතික වටිනාකමක් නොමැති වුව ද එම කඩදාසියෙහි සටහන් ගණන අනුව මූල්‍ය වටිනාකම වෙනස් වේ. කඩදාසි නිපදවීම මුලින්ම හඳුන්වාදෙන ලද්දේ චීනයේ හන් (Han) රජ පෙළපත් සමයේ (ක්‍රි.පූ. 206 - ක්‍රි.ව. 220) දී ය (සෝමදේව, 2016, පි. 177). අට වන සියවසේ මුල් භාගයේ දී වෙළඳුන් මුදල් ගනුදෙනු සඳහා බිල්පත් භාවිත කර (Hewitt, 1998, p. 91) ඇති අතර ක්‍රි.ව. 10 වන සහ 13 වන සියවස් අතර කාලයේ දී සොන්ග් (Song) රාජවංශය යටතේ කඩදාසි මුදල් නෝට්ටුවක් නිකුත් කර තිබේ (සෝමදේව, 2016: පි. 178). චීනයේ කඩදාසි මුදල් භාවිතය තහවුරුවීම සහ ක්‍රි.ව. 1260 දී මොන්ගෝලියාව මුදල් නෝට්ටු නිකුත් කිරීම ආරම්භ කිරීමත් සමඟ මුදල් නෝට්ටු ක්‍රමය ලෝකය පුරා ව්‍යාප්ත වන්නට විය (Hewitt, 1998b, p. 91)' කඩදාසි මුදල් නිර්මාණය කළ සහ එය කාර්යක්ෂමව භාවිතයට ගත් ප්‍රථම රට වනුයේ චීනයයි. ඉන් පසුව ලෝකයේ අනෙකුත් රටවල මුදල් නෝට්ටු මුද්‍රණය කළ අතර මූලිකවම ධනවත් හා බලවත්කමේ සංකේතයක් වූ මෙම මුදල් නෝට්ටුවල කලාත්මක නිර්මාණයන් ද ඇතුළත් විය.

ශ්‍රී ලංකාව යටත් විජිත රාජ්‍යයක්ව පැවති අවධියේ දී මුදල් නෝට්ටු නිෂ්පාදනය කර සංසරණය සඳහා යොදවන ලදී. ඒ ලන්දේසි පාලන සමයේ දීය. ලන්දේසි පාලන සමයේ අවසන් භාගය වන තෙක් ඔවුන් සංසරණය කරන ලද්දේ කාසිය. නමුත් මේ කාලය වන විට ලන්දේසීන්ගේ ආරක්ෂක වියදම් වැඩිවීම නිසා භාණ්ඩාගාරය හිස් වන්නට වීමත් සමඟ මුදල් නෝට්ටු නිකුතුවට පදනම වැටුණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම මුදල් නෝට්ටුව ක්‍රි.ව. 1785 ලන්දේසි ජාතික ග්‍රාෆ් ආණ්ඩුකාරවරයා (Governor Vander Graaf) විසින් පතාග (Rixdollar) නෝට්ටුව නමින් නාමික අගයක් සහිතව නිකුත් කරන ලදී (Hewitt, 1998, p. 255). ශ්‍රී ලංකාවේ පළමු වැනි මුදල් නෝට්ටු කාණ්ඩය සඳහා පතාග 50, 100, 500 සහ 1000 යන අගයන්වලින් යුක්තව මුදල් නෝට්ටු නිකුත් කර ඇති අතර විවිධ අවශ්‍යතා මත පතාග 1, 2, 3, 4, 5 සහ 10 ආදී වටිනාකම්වලින් යුක්තව ද මුදල් නෝට්ටු නිකුත් කර ඇත (Silva, 2000, p. 93). මෙම මුදල් නෝට්ටුවල ලන්දේසි, සිංහල හා දමිළ භාෂාවලින් වාක්‍යයක් ද ඇතුළත් කර ඇත.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ මුල් කාලයේ දී එනම් ක්‍රි.ව. 1796 සිට ක්‍රි.ව. 1844 දක්වා මුදල් නිකුත් කරන ලද්දේ භාණ්ඩාගාරය විසිනි (සටහන 2016: 08). එහෙත් ක්‍රි.ව. 1845-1884 දක්වා වූ කාලය මුදල් නිකුත් කිරීමේ බලය පෞද්ගලික බැංකුවලට පවරා තිබේ (Silva, 2000, p. 125). 17 සහ 18 සියවස්වල රටවල් රැසක නිදහස් බැංකු ක්‍රමය ක්‍රියාත්මක වුවත් කාලයක් ගතවන විට එහි ඇති වූ දුර්වලතා නිසා ක්‍රි.ව. 1844 බැංකු පනතින් මුදල් නිකුත් කිරීමේ ඒකාධිකාරී බලයක් එංගලන්ත බැංකුවට හිමි විය (සටහන, 2016, 08). නමුත් යටත් විජිතවල මුදල් නිකුත් කිරීමේ බලය ඔවුන් විසින් පෞද්ගලික බැංකු කිහිපයකට පමණක් ලබා දී ඇත. ඒ ක්‍රි.ව. 1844 බැංකු වරපත් ආඥා පනත (Bank Charter, 1844) යටතේ ය. මෙම වරපත් ලද බැංකු අතරින් ශ්‍රී ලංකාව තුළ මුලින්ම මුදල් නිකුත් කිරීමේ බලය ඔරියන්ටල් බැංකුවට හිමි විය (Silva, 2000, p. 125). බැංකු පරිපාලනයේ පැවති දුර්වලතා මෙන්ම ආදායමෙහි පහත වැටීම නිසා මෙම බැංකුව බිඳ වැටුණි. ඒ අනුව ආර්ථිකයේ බිඳ වැටීම වළක්වා ගැනීම සඳහා 1884 අංක 32 ව්‍යවහාර මුදල් ආඥා පනත යටතේ ව්‍යවහාර මුදල් මණ්ඩලය පිහිටුවන ලදී (The Ceylon Paper Currency Ordinance, 1884). මෙම ක්‍රමයේ දී මුදල් නිකුත් කිරීම පිළිබඳ තීරණ ගනු ලැබුවේ ත්‍රිපුද්ගල කමිටුවක් මඟිනි. මෙම ක්‍රමය යටතේ රුපියල් 1, 2, 5, 10, 50, 100, 500, 1000 සහ 10,000 යන මුදල් නෝට්ටු නිකුත් කර ඇති අතර රුපියල් 10,000 මුදල් නෝට්ටු බැංකු අතර කරන ලද ගනුදෙනු සඳහා පමණක් භාවිත කර ඇත (Silva, 2000, p. 125). ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු බිහිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ කාසි නිකුතුවේ ඇති හිඟකමයි.

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන කේන්ද්‍රීය ආයතනය වූ මහ බැංකුව පිහිටුවන ලද්දේ 1949 අංක 58 දරන මුදල් නීති පනත (The Monetary Law Act, 1949) පදනම් කරගෙනය. ඒ අනුව 1950 අගෝස්තු 28 වන දින මහ බැංකුව සිය කටයුතු ආරම්භ කර ඇති අතර එතෙක් පැවති මුදල් ව්‍යවහාර මණ්ඩලය අහෝසි විය (Silva, 2000, p. 125). මුදල් නීති පනතේ 49 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ බලය මහ බැංකුව වෙත පවරා ඇත. එතැන් සිට ශ්‍රී ලංකාවේ සම්මත මුදල් ඒකකය බවට පත් වූයේ ලංකා රුපියල් ය.

උරුමය යනු අතීතයෙන් අප ලබන, වර්තමානයේ ජීවත් වන, අනාගත පරපුරට දායාද කරන සංස්කෘතික උරුමය යන්න යුනෙස්කෝ නිර්වචනය යි (UNESCO, 2023). උරුමය ස්වාභාවික සහ සංස්කෘතික යනුවෙන් ද, ස්පර්ශ කළ හැකි සහ අස්පෘශ්‍ය යනුවෙන් ද, චංචල සහ නිශ්චල යනුවෙන් ද වර්ගීකරණය වේ. වසර 100 කට වඩා පැරණි ස්වභාවික හා සංස්කෘතික උරුමය පුරාවිද්‍යා උරුමය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ලෙස අර්ථ ගැන්විය හැකිය (Ordinance 9 of 1940). අතීත සංස්කතීන්ට බද්ධව පැවති මෙම පුරාවිද්‍යා උරුමය වර්තමානයේ දී විවිධ මාධ්‍යය මඟින් ප්‍රචාරණයට ලක් කරනු ලැබේ. මුදල් නෝට්ටු තුළ එවැනි විශේෂ උරුම ශේෂයන් අන්තර්ගත කිරීම සැළකිය යුතු කරුණකි.

මුදල් නෝට්ටුවල මුද්‍රණය කර ඇති ශ්‍රී ලාංකේය පුරාවිද්‍යා උරුමය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම මෙහි දී සිදු කෙරේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ මුදල් නෝට්ටුවල නිරූපිත ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති හඳුනා ගැනීම සහ ඒවා මුදල් නෝට්ටු තුළ නිරූපනය වීමට අදාළ නිමිති සාධක විවරණය කර ගැනීමයි.

## 2. සාහිත්‍යය විමර්ශණය

ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු පිළිබඳ පර්යේෂණ සිදු කර ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි. එම පර්යේෂණ ද සීමා වී ඇත්තේ මුදල් නෝට්ටුවල නිරූපිත රූප සටහන් හඳුනා ගැනීමට මිස ඒවා අර්ථ දැක්වීමට නොවේ. කාසි සහ මුදල් නෝට්ටු පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පිළිගත හැකි එක් පැහැදිලි ලක්ෂණයක් වූයේ එය යම් යම් අදහස් ජනතාව වෙත සන්නිවේදනය කළ හැකි ප්‍රබල මාධ්‍යයක් වන බවයි (Hewitt, 1998b). එය අතීතයේ සිටි බොහෝ පාලකයින් විසින් සිදු කර ඇති බව පැරණි කාසි අධ්‍යයනයෙන් ද පැහැදිලි වේ. එම නිසා මුදල් නෝට්ටු මත විවිධ රූප අන්තර්ගත කිරීම විවිධ අරමුණු මත පදනම්ව පවතී (Hewitt, 1998b).

මුදල් නෝට්ටු එක් අතකින් සන්නිවේදනකරුවෙකු මෙන්ම එය ජාතික අනන්‍යතාවයේ පණිවිඩ ප්‍රක්ෂේපණය කිරීමට හැකි ප්‍රියතම මාධ්‍යයකි (Hewitt, 1998c; Hewitt & Unwin, 2001). මෙක්සිකානු සහ මධ්‍යම ඇමරිකානු ජනපදවල පින්තූර නිරූපණ ජාතිකත්වයේ, ජාතික අනන්‍යතාවයේ සහ එම අනන්‍යතාව ගොඩනැගීමේ පණිවිඩයක් ලෙස තේරුම් ගත හැක්කේ කෙසේදැයි Galloy (2007) පෙන්වා දෙයි. යටත්විජිත සබඳතා, පන්ති භේද සහ ජනවාර්ගික බෙදීම් වැනි කරුණු අඛණ්ඩව හා සියුම් ලෙස ජනතාවට පණිවිඩ යැවීම සඳහා මුදල් නෝට්ටුවල රූප ඇතුළත් කර ඇත. රාජ්‍යය සහ මුදල්, සංකීර්ණ ලෙස සම්බන්ධ වී ඇති බවත් ජාතිය ගොඩනැගීමේදී එක්සත් ජනපදයේ මුදල් නෝට්ටුවල ජනසන්නිවේදන මාධ්‍යයක් ලෙස භූමිකාවක් ඇති බවත් Lauer (2008) සටහන් කරයි. ලෝහ කාසිවලට සාපේක්ෂව මුදල් නෝට්ටුවල ඇති පැහැදිලි වටිනාකම සෑදීම සඳහා උපායමාර්ග සකස් කිරීමේ දී, මුදල් නෝට්ටු නීත්‍යානුකූල කිරීම සාක්ෂාත් කර ගැනීම සහ තාර්කිකකරණය තුළින් සිදු වේ. පළමුවැන්න සාක්ෂාත් කරගනු ලබන්නේ රජයේ විධිමත් දේශපාලන නීතී අධිකාරිය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරීමෙනි. දෙවනුව ජාතියේ ගෞරවනීය මුතුන් මිත්තන්ගේ මූලාරම්භය හා ඉතිහාසය සම්බන්ධ නිරූපණ භාවිත කිරීමෙනි. මුදල් නෝට්ටුවල මෙම නිරූපණ දෙවර්ගයම එක්ව ජාතික අනන්‍යතාව සාක්ෂාත් කරගෙන ඇත (Lauer, 2008: 111). Gilbert and Helliener (1999) මුදල් නෝට්ටුවල ඓතිහාසික තොරතුරු ඇතුළත් නිරූපන අන්තර්ගත වීම එම රාජ්‍යයේ මුදල්වල වටිනාකම නිගමනය කරන බව සඳහන් කරයි.

Hewitt (1998a) ක්‍රි.ව. 1800 සිට 1941 දක්වා ශ්‍රී ලංකාවේ භාවිත කිරීම සඳහා එංගලන්තයේ මුද්‍රණය කරන ලද මුදල් නෝට්ටු ගැන සාකච්ඡා කර ඇත. මෙම අධ්‍යයනයේ දී හෙවිට් පෙන්වා දී ඇත්තේ මුදල් නෝට්ටුවල පසුපස නිරූපිත රූප සටහන්වලින් ඒවා නිකුත් කරන්නාගේ භූගෝලීය හා සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු වන බවයි. මෙම මුදල් නෝට්ටු බටහිර යුරෝපීය බලයක් යටතේ නිකුත් කළ බව ප්‍රකාශ කරන අතර බ්‍රිතාන්‍යයන් විසින් නිකුත් කරන ලද අවසාන මුදල් නෝට්ටුවලින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාව යටත්විජිත රාජ්‍යයක සිට ස්වාධීන ජාතියක් දක්වා ගමන් කරනා ආකාරයක් බව ඔහු තවදුරටත් සඳහන් කරයි.

වර්ෂ 1948 දී නිදහස ලැබීමට පෙර සිටම ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටුවල ස්වාභාවික සුන්දරත්වය සහ, ඓතිහාසික උරුමය නිරූපනය වන චිත්‍ර සටහන් අන්තර්ගත කර ඇත. කෙසේ වෙතත් මුදල් නෝට්ටුවල පුරාවිද්‍යාත්මක උරුමය ඇතුළත් කිරීමට හේතු විවිරණය කිරීම පිණිස අධ්‍යයනයන්හි යොමු වී නොමැති කරම් ය.

Silva (2000) ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද මුදල් නෝට්ටු පිළිබඳ ඡායාරූප සහ ඒවායෙහි  අන්තර්ගත රූප සටහන් පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරයි. එහි කාසි සහ මුදල් නෝට්ටු රටේත්  ප්‍රජාවගේත් ස්වාධීනත්වය පිළිබිඹු කිරීම සදහා යොදා ගෙන ඇතැයි සදහන් කරන නමුත්, ඒවායෙහි පුරාවිද්‍යාත්මක වැදගත්කම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර නොමැත. තව ද, මුදල් නෝට්ටු කාණ්ඩවල ‘ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමය සංකේතවත් කිරීම’ (මහ බැංකුව, 2013, පි. 121) අරමුණුගත තේමාවක් වූ නමුත් ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති යෙදීමට හේතු මෙතෙක් කිසිදු තැනක විස්තර කර නොමැත.

## 3. අධ්‍යයන අරමුණු සහ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමෙන් අනතුරුව නිකුත් කරන ලද මුදල් නෝට්ටු කාණ්ඩ ආශ්‍රිතව නිරූපිත ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති හඳුනාගැනීම සහ ඒවා මුදල් නෝට්ටු තුළ නිරූපනය කිරීමට හේතු විවරණය කර ගැනීමයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු ලබාගැනීමේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ ක්ෂේත්‍ර නිරීක්ෂණය කෙරෙහි ය. එහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ මාතර ශාඛා කෞතුකාගාරයේ මුදල් නෝට්ටු අධ්‍යයනය කරන ලදී. පළමු වන මුදල් නෝට්ටු කාණ්ඩයේ සිට 11 වන මුදල් නෝට්ටු කාණ්ඩය (වර්ෂ 1950-2013) මුද්‍රිත මුදල් නෝට්ටු සහ, විශේෂයෙන් 1998,


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

2009 සහ 2013 යන වර්ෂවල නිකුත් කළ සැමරුම් මුදල් නෝට්ටු ද එකිනෙක අධ්‍යයනය කිරීම එහි දී සිදු විය.

සමස්තයක් වශයෙන් ශ්‍රී මහ බැංකුව කාණ්ඩ 11ක් යටතේ නිකුත් කළ නෝට්ටු 56ක් අනුස්මරණ නෝට්ටු 3ක් සමගින් නෝට්ටු 59ක් මෙම අධ්‍යයනය සඳහා යොදා ගැණිනි. නෝට්ටු කාණ්ඩ 11 සහ අනුස්මරණ නෝට්ටු යටතේ නිකුත් වූ රුපියලේ සිට රුපියල් 5000 දක්වා වටිනාකම් කාණ්ඩ 12කි. ඒ රුපියල් 1, 2, 5, 10, 20, 50, 100, 200, 500, 1000, 2000 සහ 5000 යන වටිනාකමින් යුත් මුදල් නෝට්ටුයි.

මෙම අධ්‍යයනයේ දී මහ බැංකුව මගින් ප්‍රකාශිත සඟරා, ග්‍රන්ථ මෙන්ම ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මූලාශ්‍ර පරිශීලනය කෙරිණි. විශ්ලේෂණය කරන ලද එම දත්ත සංඛ්‍යා ලේඛන සහ ප්‍රස්ථාර ඇසුරින් ඉදිරිපත් කර ඇත.

| කාණ්ඩය | නිකුත් කළ වර්ෂය | තේමාව | නෝට්ටුවල වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| 1 | 1951 | VI වන ජෝර්ජ් රජු | 1, 10 |
| 2 | 1952 | II වන එළිසබත් රැජිණ | 1, 2, 5, 10, 50, 100 |
| 3 | 1956 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය | 1, 2, 5, 10, 50, 100 |
| 4 | 1962 | එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක | 2, 5, 10, 50, 50, 100, 100 |
| 5 | 1965 | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | 2, 5, 10, 50, 100 |
| 6 | 1972 | ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ලාංඡනය | 50, 100 |
| 7 | 1979 | අසිරිමත් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය (වන සතුන් සහ වෘක්ෂලතා) | 2, 5, 10, 20, 50, 100 |
| 8 | 1981 | ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක ස්ථාන | 5, 10, 20, 50, 100, 500, 1000 |
| 9 | 1987 | ඓතිහාසික සහ සංවර්ධනය විදහා දැක්වීම | 500, 1000 |
| 10 | 1991 | ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමය | 10, 20, 50, 100, 500, 1000 |
| | 2006 | | 2000 |
| 11 | 2011 | සංවර්ධනය, සෞභාග්‍යය සහ ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන් | 20, 50, 100, 500, 1000, 5000 |
| අනුස්මරණ නෝට්ටු | 1998 | 50 වැනි නිදහස් සංවත්සරය | 200 |
| | 2009 | ශ්‍රී ලංකාවට සාමය සහ සෞභාග්‍යය උදාවීම සැමරීම | 1000 |
| | 2013 | පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම | 500 |

වගුව 1: විවිධ කාණ්ඩවලට අදාළව මුදල් නෝට්ටුවල ඇති තේමා
(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය - 2019/2020)

## 4. ප්‍රතිඵල

### ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු කාණ්ඩවලට මූලික වූ තේමාවන්

වර්ෂ 1951 වන තුරු ශ්‍රී ලංකාවේ සංසරණය වූයේ බ්‍රිතාන්‍යයන් විසින් නිකුත් කළ මුදල් නෝට්ටු ය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1951 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ සංසරණය සඳහා මුදල් නෝට්ටු නිකුත් කිරීමට පටන් ගෙන ඇති අතර 2011 වර්ෂය දක්වා කාණ්ඩ 11 යටතේ සහ 1998, 2009 සහ 2013 වර්ෂවල සැමරුම් වශයෙන් ද මුදල් නෝට්ටු නිකුත් කර තිබේ. ඔවුන් එසේ කාණ්ඩ වශයෙන් මුදල් නෝට්ටු නිකුත් කිරීමේ දී ඒ ඒ කාණ්ඩ සඳහා විවිධ තේමාවන් යොදාගෙන ඇත. එම තේමාවලට අදාළව මුදල් නෝට්ටුවල අභිමුඛය සහ ප්‍රතිමුඛය සඳහා රූප සටහන් යොදා ගැණිනි. ඒ අතරින් ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති රැගත් රූප සටහන් බහුලව මුදල් නෝට්ටු තුළ මුද්‍රණය විය.

කාණ්ඩ වශයෙන් මුදල් නෝට්ටු නිකුත් කිරීමේ දී ඒ ඒ කාණ්ඩ සඳහා විවිධ තේමාවන් (වගුව 1) යොදාගෙන ඇත. එම තේමාවලට අදාළ ව මුදල් නෝට්ටුවල අභිමුඛය සහ ප්‍රතිමුඛය සඳහා විවිධ රූප සටහන් යොදා ඇති ආකාරය අධ්‍යයනයේ දී පැහැදිලි විය.

මුදල් නෝට්ටු කාණ්ඩවල තේමාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී (වගුව 1) පැහැදිලි වන්නේ ඒ ඒ කාලකවානුවල නිකුත් කළ මුදල් නෝට්ටු සඳහා විවිධ තේමා යොදාගෙන ඇති බවයි.

සමකාලීන විශේෂිත සිදුවීම් හෝ ශ්‍රී ලංකාවට ආවේණික ස්වාභාවික පරිසරාත්මක ලක්ෂණවලින් සමන්විත රූප මෙම මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ දී යොදාගෙන තිබේ. ඒ හැරෙන්නට මෙම මුදල් නෝට්ටුවල ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වැදගත්කම සහිත රූප ද යොදාගෙන තිබෙනු දැකිය හැකි විය.

### ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපිත මුදල් නෝට්ටු

වර්ෂ 1951 සිට මුද්‍රිත මුදල් නෝට්ටු කාණ්ඩ අතරින් ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති, මුදල් නෝට්ටුවල අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ නිරූපනය වී ඇති අකාරය පහත වගුවෙන් පැහැදිලි කරගත හැකිය.

| කාණ්ඩය | නිකුත් කළ වර්ෂය | නෝට්ටුවල වටිනාකම (රුපියල්) | අභිමුඛය | ප්‍රතිමුඛය |
|---|---|---|---|---|
| 1 | 1951 | 1 | වෙනත් | පැරණි ගොඩනැගිලි දොරටු කැටයම් |
| | | 10 | වෙනත් | මුරගල |
| 2 | 1952 | 1 | වෙනත් | පැරණි ගොඩනැගිලි දොරටු කැටයම් |
| | | 2 | වෙනත් | මැදිරිගිරිය වටදාගෙය |
| | | 5 | වෙනත් | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව |
| | | 10 | වෙනත් | මුරගල |
| | | 50 | වෙනත් | සඳකඩපහණ |
| | | 100 | වෙනත් | සීගිරි ළඳුන් |
| 3 | 1956 | 1 | වෙනත් | පැරණි ගොඩනැගිලි දොරටු කැටයම් |
| | | 2 | වෙනත් | මැදිරිගිරිය වටදාගෙය |
| | | 5 | වෙනත් | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව |
| | | 10 | වෙනත් | මුරගල |
| | | 50 | වෙනත් | සඳකඩපහණ |
| | | 100 | වෙනත් | සීගිරි ළඳුන් |
| 4 | 1962 | 2 | වෙනත් | මැදිරිගිරිය වටදාගෙය |
| | | 5 | වෙනත් | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව |
| | | 10 | වෙනත් | මුරගල |
| | | 100 | වෙනත් | පොළොන්නරුව වටදාගෙය |
| 5 | 1965 | 2 | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | මැදිරිගිරිය වටදාගෙය |
| | | 5 | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | නිශ්ශංකමල්ල රජුගේ රාජසභාවේ ගලින් කළ සිංහ රූපය |
| | | 10 | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | මුරගල |
| | | 50 | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | සඳකඩපහණ |
| | | 100 | මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | සීගිරි ළඳුන් |


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

| | | | | |
|---|---|---|---|---|
| 6 | 1972 | 100 | වෙනත් | පොළොන්නරුව වටදාගෙය |
| 8 | 1981 | 5 | පොළොන්නරුව වටදාගෙය | මුරගල |
| | | 10 | දළදා මාළිගාවේ පත්තිරිප්පුව | කැළණි විහාර ස්තූපය |
| | | 20 | සඳකඩපහණ සහ කොරවක්ගල | ථූපාරාම ස්තූපය |
| | | 50 | කැළණි විහාරය | පොළොන්නරුව ලංකාතිලක විහාරය |
| | | 100 | කැටයම් සහිත ශිලාමය කොරවක්ගල | වෙනත් |
| | | 500 | දළදා මාළිගාවේ ගලින් කළ ඇත් රූපය | අභයගිරිය ස්තූපය |
| | | 1000 | වෙනත් | වෙනත් |
| 9 | 1987 | 500 | දළදා මාළිගාවේ ගලින් කළ ඇත රූපය | අභයගිරිය ස්තූපය |
| | | 1000 | වෙනත් | වෙනත් |
| 10 | 1991 | 10 | යාපහුවේ ශිලාමය සිංහ රූපය සහ සඳකඩපහණ | වෙනත් |
| | | 20 | වෙනත් | වෙනත් |
| | | 50 | සඳකඩපහණ සහ මුරගල | ථූපාරාම සහ ජේතවන ස්තූප, කැටයම් සහිත කවු මිටත් සහ බන්දේසියක් |
| | | 100 | පැරණි විසිතුරු සඳකත් සහ සඳකඩපහණ | වෙනත් |
| | | 500 | සඳකඩපහණ සහ ශ්‍රී මහා බෝධිය | රුවන්වැලිසෑය ස්තූපය |
| | | 1000 | සිංහ රූප කැටයම් සහ සඳකඩපහණ | දළදා මාළිගාවේ පත්තිරිප්පුව |
| | 2006 | 2000 | සිගිරි පර්වතය | සිගිරි ළඳුන් |
| 11 | 2011 | 20 | වෙනත් | පුන්කලස සහිත මුරගල |
| | | 50 | දෙමෝදර ආරුක්කු නවයේ පාලම | පුන්කලස සහිත මුරගල |
| | | 100 | වෙනත් | නාගරාජ මුරගල |
| | | 500 | මහනුවර ලංකාතිලක විහාරය | පද්මනිධි මුරගල |
| | | 1000 | වෙනත් | සතිරව රූප සහ දිසා පාලක රූප සහිත මුරගල |
| | | 5000 | වෙනත් | රත්නප්‍රාසාද මුරගල |
| අනුස්මරණ නෝට්ටු | 1998 | 200 | වෙනත් | දළදා මාළිගාව |
| | 2009 | 500 | මහනුවර ලංකාතිලක පිළිමගෙය | පද්මනිධි මුරගල |
| | 2013 | 1000 | වෙනත් | සතිරව රූප සහ දිසා පාලක රූප සහිත මුරගල |

වගුව 2: මුදල් නෝට්ටුවල අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ නිරූපිත ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති
(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය - 2019/2020)

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රථම මුදල් නෝට්ටු කාණ්ඩය 1951 වසරේ දී නිකුත් කර ඇති අතර එහි මූලික තේමාව බ්‍රිතාන්‍යයට ලබා දී තිබුණ ද දේශීයත්වය නිරූපනය කිරීමට යොදන ලද ප්‍රයත්නයක් ද එහි දක්නට ලැබේ. වර්ෂ 1951 දී නිකුත් කරන ලද රුපියලේ මුදල් නෝට්ටුවේ පැරණි ගොඩනැගිලි දොරටු රූපයක් අන්තර්ගත වන අතර, එහි පියගැටපෙළ, කොරවක්ගල, සඳකඩපහණ සහ මුරගල කැටයම් පැහැදිලි ලෙස දැකගත හැකි වේ. එමෙන්ම රුපියල් 10 මුදල් නෝට්ටුවේ ද මුරගලක මූර්තියක් නිරූපිතය (වගුව 2).

වර්ෂ 1952 සහ 1956 නිකුත් කළ සියලුම මුදල් නෝට්ටුවල පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනය කර ඇත්තේ මුදල් නෝට්ටුවල ප්‍රතිමුඛයේ ය. වර්ෂ 1962 නිකුත් කළ රුපියල් 2, 5, 10 සහ 100 යන අගයන්ගෙන් යුත් මුදල් නෝට්ටුවල ප්‍රතිමුඛයේ පමණක් පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනය වේ. මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව තේමාව කරගනිමින් වර්ෂ 1965 නිකුත් කරන ලද සියලුම මුදල් නෝට්ටුවල පුරාවිද්‍යා ස්ථාන නිරූපිත රූ සටහන්, කැටයම් සහ සිතුවම් නිරූපනය කර ඇත. නමුත් වර්ෂ 1972 නිකුත් කළ රුපියල් 100 අගයෙන් යුත් මුදල් නෝට්ටුවේ පමණක් පොළොන්නරුව වටදාගෙය නිරූපිතය. වර්ෂ 1979 නිකුත් කළ සියුලම මුදල් නෝට්ටු සඳහා මුළුමනින්ම වස්තු විෂය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ අසිරිමත් ජෛව විවිධත්වයයි. වර්ෂ 1981 දී නිකුත් කළ 8 වන කාණ්ඩය සඳහා තේමාව වී ඇත්තේ ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක ස්ථාන යන්නයි. පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති සනිටුහන් මෙම කාණ්ඩය යටතේ හඳුන්වාදුන් නව මුදල් නෝට්ටුවක් වන රුපියල් 1000 මුදල් නෝට්ටුවේ පමණක් එම කාලවකවානුවේ සිදු වූ සංවර්ධන ව්‍යාපෘතියක් දක්වා ඇත.

වර්ෂ 1987 නිකුත් වූයේ රුපියල් 500 සහ 1000 මුදල් නෝට්ටු පමණක් නිසා එයින් රුපියල් 500 මුදල් නෝට්ටුවේ ප්‍රධාන සිතුවම වූයේ පුරාවිද්‍යාත්මක ස්ථානයක් වූ අභයගිරිය ස්තූපයයි. පෞරාණික උරුමය තේමාව කර ගනිමින් වර්ෂ 1991 නිකුත් කළ මුදල් නෝට්ටුවල ද පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපිත සිතුවම් දක්නට ලැබේ. රුපියල් 10, 50, 100, 500, 1000 සහ 2000 යන මුදල් නෝට්ටුවල පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති මැනවින් සිතුවම් කර ඇති ආකාරය හඳුනාගත හැකිය. සෞභාග්‍යය සහ සංවර්ධනය තේමාව කර ගනිමින් 11 වන කාණ්ඩය 2011 වසරේ දී නිකුත් කර ඇත. එම තේමාවට ගැළපෙන ආකාරයට මුදල් නෝට්ටුවල අභිමුඛය සහ ප්‍රතිමුඛය සිතුවම් කර ඇති අතර ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති ඒ තුළ ද නිරූපිතය (වගුව 2).

රුපියල් 200, 500 සහ 1000 වශයෙන් අනුස්මරණ මුදල් නෝට්ටු තුනක් 1998, 2009 සහ 2013 යන වර්ෂවලදී මුද්‍රණය කර ඇති අතර එම මුදල් නෝට්ටු තුනෙහිම පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපිත සිතුවම් දක්නට ලැබේ (වගුව 2).

මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරනු ලැබුවේ එක් එක් කාණ්ඩවලට අදාළව නිකුත් කළ විවිධ අගයන්ගෙන් යුත් මුදල් නෝට්ටුවල නිරූපනය වී ඇති පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති පිළිබඳව ය. මෙසේ විවිධ වර්ෂවල නිකුත් කර ඇති රුපියල් 1 සිට රුපියල් 5000 දක්වා වූ විවිධ අගයන්ගෙන් යුත් මුදල් නෝට්ටුවල අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති බහුල වශයෙන් යොදාගෙන ඇති ආකාරයක් දැකගත හැකිය (වගුව 2).

## 5. සාකච්ඡාව

**මුදල් නෝට්ටු කාණ්ඩවල නිරූපිත පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති**

ශ්‍රී ලංකාවේ අභිමානය නිරූපනය කෙරෙන පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති විවිධ අගයන්ගෙන් යුත් මුදල් නෝට්ටුවල සනිටුහන් වී ඇති ආකාරය පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

| පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති: වර්ගය සහ නිර්මාණ | සංස්කරණය | නිකුත් කළ වර්ෂය | නෝට්ටුවල වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| **වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් (ආගමික)** | | | |
| **ස්තූප** | | | |
| ථූපාරාම ස්තූපය | 08 | 1981 | 20 |
| | 10 | 1991 | 50 |
| අභයගිරිය ස්තූපය | 08 | 1981 | 500 |
| | 09 | 1987 | 500 |
| ජේතවනාරාම ස්තූපය | 10 | 1991 | 50 |
| රුවන්වැලිසෑය | 10 | 1991 | 500 |
| කැළණි විහාර ස්තූපය | 08 | 1981 | 10 |
| **වටදාගෙය** | | | |
| පොළොන්නරුව වටදාගෙය | 04 | 1962 | 100 |
| | 06 | 1972 | 100 |
| | 08 | 1981 | 05 |
| මැදිරිගිරිය වටදාගෙය | 02 | 1952 | 02 |
| | 03 | 1956 | 02 |
| | 04 | 1962 | 02 |
| | 05 | 1965 | 02 |
| **ප්‍රතිමාගෘහ** | | | |
| පොළොන්නරුව ලංකාතිලක විහාරය | 08 | 1981 | 50 |
| මහනුවර ලංකාතිලක විහාරය | 11 | 2011 | 500 |
| | අනුස්මරණ නෝට්ටු | 2013 | 500 |
| කැළණි විහාරය | 08 | 1981 | 50 |
| **වෙනත්** | | | |
| දළදා මාළිගාවේ පත්තිරුප්පුව | 08 | 1981 | 10 |
| | 10 | 1991 | 1000 |
| දළදා මාළිගාව | අනුස්මරණ නෝට්ටු | 1998 | 200 |
| **වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් (ආගමික නොවන)** | | | |
| දෙමෝදර ආරුක්කු නවයේ පාලම | 11 | 2011 | 50 |
| **සිතුවම්** | | | |
| සීගිරි ළඳුන් | 02 | 1952 | 100 |
| | 03 | 1956 | 100 |
| | 05 | 1965 | 100 |
| | 10 | 2006 | 2000 |
| **කැටයම් සහ මූර්ති නිර්මාණ** | | | |
| පියගැටපෙළ සහිත ද්වාර මණ්ඩපය | 01 | 1951 | 01 |
| | 02 | 1952 | 01 |
| | 03 | 1956 | 01 |
| රත්නප්‍රාසාද මුරගල | 01 | 1951 | 10 |
| | 02 | 1952 | 10 |
| | 03 | 1956 | 10 |
| | 04 | 1962 | 10 |
| | 05 | 1965 | 10 |
| | 08 | 1981 | 05 |
| | 10 | 1991 | 50 |
| | 11 | 2011 | 5000 |
| නාගරාජ මුරගල | 11 | 2011 | 100 |
| පද්මනිධි මුරගල | 11 | 2011 | 500 |
| | අනුස්මරණ නෝට්ටු | 2013 | 500 |
| බහිරව රූප සහ දිසා පාලක රූප සහිත මුරගල | 11 | 2011 | 1000 |
| පුන්කලස සහිත මුරගල | 11 | 2011 | 20, 50 |
| සඳකඩපහණ | 02 | 1952 | 50 |
| | 03 | 1956 | 50 |
| | 05 | 1965 | 50 |
| | 08 | 1981 | 20 |
| | 10 | 1991 | 10, 50, 100, 500, 1000 |
| කොරවක්ගල | 08 | 1981 | 20, 100 |
| මහා පරාක්‍රමබාහු ප්‍රතිමාව | 02 | 1952 | 05 |
| | 03 | 1956 | 05 |
| | 04 | 1962 | 05 |
| | 05 | 1965 | 02, 05, 10, 50, 100 |
| සිංහ රූප කැටයම | 10 | 1991 | 1000 |
| නිශ්ශංකමල්ල රජුගේ රාජසභාවේ ගලින් කළ සිංහ රූපය | 05 | 1965 | 05 |
| දළදා මාළිගාවේ ගලින් කළ ඇත් රූපය | 08 | 1981 | 500 |
| | 09 | 1987 | 500 |
| යාපහුවේ ශිලාමය සිංහ රූපය | 10 | 1991 | 10 |
| **පුරාවිද්‍යාත්මක ස්ථාන** | | | |
| සීගිරි පර්වතය | 10 | 1991 | 2000 |
| ශ්‍රී මහා බෝධිය | 10 | 1991 | 500 |
| **කෞතුක භාණ්ඩ** | | | |
| කැටයම් සහිත කඩු මිටක් | 10 | 1991 | 50 |
| කැටයම් සහිත බන්දේසියක් | 10 | 1991 | 50 |
| පේසත් | 10 | 1991 | 2000 |
| පැරණි විසිතුරු බඳුනක් | 10 | 1991 | 100 |

වගුව 3: විවිධ අගයන්ගෙන් යුත් මුදල් නෝට්ටුවල නිරූපිත පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති
(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය - 2019/2020)

වර්ෂ 1951 සිට 2011 දක්වා නිකුත් කළ මුදල් නෝට්ටුවල ඇති පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති ඉහත වගුවට අනුව මෙසේ වර්ගීකරණය කළ හැකිය. ආගමික සහ ආගමික නොවන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් යනුවෙන් කොටස් දෙකකට වෙන් කළ හැකිය. ආගමික වාස්තුවිද්‍යාත්මක ඉදිරීම් යටතේ ස්තූප, වටදාගෙය, ප්‍රතිමාගෘහ සහ වෙනත් යනුවෙන් වර්ගීකරණය කර ඇත. දෙමෝදර ආරුක්කු නවයේ පාලම ආගමික නොවන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීමකි. සිතුවම්, කැටයම්, මූර්ති නිර්මාණ සහ කෞතුක භාණ්ඩ කලා කෘති යටතේ වර්ගීකරණය කර ඇත (වගුව 3).

**පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති මුදල් නෝට්ටුවලට යොදා ගැනීමට හේතු**

ශ්‍රී ලංකාවේ බහුලව සංසරණය වන මුදල් නෝට්ටුවලට පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනය කිරීමට මුල් වූ සුවිශේෂී කරුණු පවතී ද යන්න විමසීම සඳහා එක් එක් උරුම අංග සතු වටිනාකම් හඳුනාගැනීම අත්‍යවශ්‍යය.

මුදල් නෝට්ටුවල නිරූපිත වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ආගමික හා ආගමික නොවන ඉදිකිරීම් ලෙස වර්ග කළ හැකි ය (වගුව 3). ආගමික ඉදිකිරීමක් ලෙස සලකන ස්තූපය, මුදල් නෝට්ටුවල නිරූපිත ප්‍රමුඛ අංගයක් වේ. ස්තූපයක් යනු ධාතු තැන්පත් කර සාදන ලද වාස්තුවිද්‍යා නිර්මාණාංගයකි (පරණවිතාන, 1995, පි. 1). ශ්‍රී ලංකාවේ ඉදි වූ පළමු ස්තූපය ලෙස සැළකෙන දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයට (ක්‍රි.පූ. 307-267) අයත් ථූපාරාමය (පරණවිතාන, 1995, පි. 4) ද බෞද්ධ ලෝකයේ උසම ගඩොල් ස්මාරකය ලෙස සැලකෙන මහසෙන් රාජ්‍ය කාලයේ (ක්‍රි.ව. 276-302) ඉදි කළ ජේතවනාරාම ස්තූපය (පරණවිතාන, 1995, පි. 7) ද මුදල් නෝට්ටුවල නිරූපනය කර තිබේ (වගුව 3). එසේම වළගම්බා රාජ්‍ය කාලයේ (ක්‍රි.පූ. 89-76) ඉදි වූ අභයගිරිය ස්තූපය (පරණවිතාන, 1995, පි. 6), දුටුගැමුණු රාජ්‍ය කාලයේ (ක්‍රි.පූ. 161-137) ඉදි කළ මහාථූපය ලෙස හැඳින් වූ රුවන්වැලිසෑය (පරණවිතාන, 1995, පි. 5) ද කැළණි විහාර ස්තූපය ද මුදල් නෝට්ටු අතර දැකිය හැකිය (වගුව 3).

වාස්තුවිද්‍යා ඉදිකිරීම් යටතේ ආගමික වටිනාකමක් සහිත ඉදිකිරීමක් වන දළදා මාළිගය සහ පත්තිරුප්පුවට ප්‍රධාන තැනක් හිමි වේ. බුදුන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතුව තැන්පත් කර ඇති මහනුවර යුගයේ විශිෂ්ට නිර්මාණය සේ සැළකෙන දළදා මාළිගය දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශණය හිමි වූ ප්‍රධාන ස්ථානයක් සේ සළකනු ලබයි.

අනුරාධපුරය, පොළොන්නරු, මහනුවර යනා දී යුගවල ඉදි වූ වාස්තුවිද්‍යාත්මක වටිනාකමින් යුතු නිර්මාණ ද මුදල් නෝට්ටුවලට අන්තර්ගත කර ඇති ආකාරය දැකිය හැකිය. ඒ අතරින් පොළොන්නරු යුගයේ දී ඉදි වූ විශිෂ්ට වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කරන ආගමික ඉදිකිරීම් ලෙස සලකනු ලබන


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

පොළොන්නරුව වටදාගෙය සහ මැදිරිගිරිය වටදාගෙය ද මුදල් නෝට්ටුවල සිතුවම් කර තිබේ (වගුව 3). පොළොන්නරුව වටදාගෙය දේශීය ගෘහනිර්මාණ ශිල්පයේ දියුණු අවස්ථාවක් පිළිබිඹු කරන ඉදිකිරීමකි. ද්විත්ව වේදිකාවක් මත ඉදි වූ මෙම වටදාගෙය බෙහෙවින්ම සමබර වූ කලාත්මක ගොඩනැගිල්ලකි. බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ දැකුම්කළු නිර්මාණයක් වන මැදිරිගිරිය විහාරයේ ඇති වටදාගෙය IV වන අග්ගබෝධි රාජ්‍ය කාලයේ (ක්‍රි.ව. 677-683) දී මලයරාජයන් විසින් කරන ලද වාස්තු අංගයකි (සෙනවිරත්න, 1966, පි. 46). මෙම නිර්මාණ ශ්‍රී ලාංකිකයාගේ කලා කෞෂල්‍යය හා නිර්මාණ තාක්ෂණය මැනවින් නිරූපනය කරන්නක් බැවින් මුදල් නෝට්ටු සඳහා යොදා ගන්නට ඇත.

ප්‍රතිමාඝර යනු බුදු පිළිම තැන්පත් කිරීම සඳහාම ඉදි කරන ලද ගෘහයයි. එය අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ක්‍රමයෙන් විකාශනය වී වර්තමානයේ පවතින තත්වය තෙක් සංවර්ධනය වී ඇත. I වන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ (ක්‍රි.ව. 1153-1186) ඉදි කරන ලද ගෙඩිගේ සම්ප්‍රදායේ පිළිමගෙයක් ලෙස හඳුනාගෙන ඇති පොළොන්නරුවේ විශාලතම පිළිමගෙය වූ ලංකාතිලක විහාරය ද මුදල් නෝට්ටුවල සිතුවම් කර තිබේ (වගුව 3). මෙහි ඇතුළත හා පිටත බිත්ති සිතුවම්වලින් අලංකාර කර තිබූ බවට සාධක වර්තමානයේ ද දැකගත හැකිය (බස්නායක, 1995, පි. 306). මෙම පිළිමගෙය සැලසුම්කරණය සහ සංකල්පය අතින් අද්විතීය නිර්මාණයක් ලෙස සැළකේ. මහනුවර ලංකාතිලක පිළිමගෙය සහ කැළණි විහාරය ද මුදල් නෝට්ටු තුළ නිරූපණය කර ඇත්තේ එම නිර්මාණවල වූ කලාත්මක හා ඓතිහාසික වටිනාකම සනිටුහන් කර වීමටය.

වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් යටතේ ගැනෙන දෙමෝදර ආරුක්කු නවයේ පාලම ද මුදල් නෝට්ටුවල නිරූපිත අතර එය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ පාලම් ඉදිකිරීමේ තාක්ෂණය සහ ගමනාගමනය නිරූපනය කරනු ලබයි.

ඓතිහාසික වටිනාකමකින් යුතු අනුරාධපුර ශ්‍රී මහා බෝධිය ද ලෝක ප්‍රකට නිර්මාණ ලෙස සැලකෙන සීගිරි පර්වතය සහ අප්සරාවන් නිරූපිත සීගිරි බිතුසිතුවම් ද මුදල් නෝට්ටුවලට යොදාගෙන ඇත (වගුව 3). සීගිරිය වූ කලි භෞතික පරිසරයත් සෞන්දර්යත් තාක්ෂණයත් කලා කෞශල්‍යයත් සම්මිශ්‍රණය වූ රමණීය පරිශ්‍රයකි. පොළොවෙන් අඩි 600 ක් පමණ උසට නැගී ගිය අපූර්ව හැඩයක් ගත් ගල් පර්වතයක් ඇසුරු කරගෙන පැරණි නිර්මාණ ශිල්පීන් විසින් ඉදි කරන ලද සීගිරිය, කාශ්‍යප රජු (ක්‍රි.ව. 473-491) විසින් තම බලකොටුව මෙන්ම රජ මාළිගය බවට ද පත්කර ගෙන තිබේ (ගුණවර්ධන, 1998, පි. 13).

ශ්‍රී ලාංකේය සිතුවම් කලා ඉතිහාසයේ ප්‍රමුඛ ස්ථානයක් සීගිරියේ සුප්‍රකට අප්සරා බිතුසිතුවම්වලට ලැබේ. වර්තමානය වනවිට ඉතිරිව ඇත්තේ පර්වත ආවරණ සහිත විවරයේ නිමවන ලද සිතුවම් ස්වල්පයක් පමණි. දිව්‍ය අප්සරාවන්, විජ්ජුලතාවන්, කසුප් රජුගේ අන්තඃපුර බිසවුන් සහ සේවිකාවන්, කසුප් රජුගේ දියණියන් යනා දී විවිධ අයුරින් හඳුනාගන්නට වෑයම් කරන මේ සිතුවම් ලොව සුපතල බිතුසිතුවම් කලාවක් ලොවට කියාපෑම සනිටුහන් කරමින් මුදල් නෝට්ටුවලට යොදාගෙන ඇත.

මුදල් නෝට්ටුවල කැටයම් සහ මූර්ති නිර්මාණවලට ද ප්‍රධානත්වයක් ලබා දී ඇත. ශ්‍රී ලාංකේය පැරණි ගොඩනැගිලි දොරටු සහ ඒ ආශ්‍රිත නිර්මාණ ද මුදල් නෝට්ටු ගණනාවක දැකිය හැකිය. සඳකඩපහණ, මුරගල, කොරවක්ගල හා පියගැටපෙළ යනාදී නිර්මාණාංග ඒකීය මෙන්ම සියල්ල එකට බද්ධ වී ඇති ද්වාර මණ්ඩප ලෙස ද මුදල් නෝට්ටුවල සිතුවම් කර ඇත (වගුව 3). මෙම නිර්මාණාංග මුළු ගොඩනැගිල්ලේම සෞන්දර්යාත්මක ඒකාබද්ධතාව ඇකදෙන වාස්තුවිද්‍යාත්මක කලාංගයක් වූ නිසා ඒවායෙහි විශිෂ්ටත්වය පිළිබිඹු කිරීමට මුදල් නෝට්ටුවලට යොදාගෙන ඇත.

අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා කාලයේ දී සෑම ආගමික ස්ථානයකට ම පිවිසීමට සකස් කළ දොරටුවලට අනුබද්ධව දර්ශනීය පියගැටපෙළක් නිර්මාණය කිරීම සම්මත සම්ප්‍රදායක් විය. පියගැට පේළිය සමන්විත වූයේ සඳකඩපහණ, මුරගල සහ කොරවක්ගල ඇසුරු කරගෙනය. කොරවක්ගල යනු පියගැටපෙළ දෙපස අත්වැල මෙන් තනා ඇති කොටස වේ. පසුකාලයේ දී මකර රූපයකින් එය සරසා ඇත. කොරවක්ගල කෙළවර දෙපස ද්වාර පාලක රූප (මුරගල්) දෙකකි. අනුරාධපුර මහසෙන් සහ බිසෝ මාළිගයේ පියගැට පෙළ හා පොළොන්නරුව වටදාගෙය පියගැට පෙළ වාමන රූපවලින් සරසා ඇත (වික්‍රමගමගේ, 1995, පි. 34). එසේ සැරසිලි මෝස්තරවලින් යුක්තවීම නිසා දොරටුවේ ඇති කලාත්මක අංගවල සමබරතාවක් ඇති වී තිබේ. ආගමික සහ ලෞකික ගොඩනැගිලිවල ගම්භීරත්වය, අංග සම්පූර්ණ බව, අලංකාරය සහ ආරක්ෂාව පිළිබඳ සංකල්ප ජනිත කිරීම සඳහා මුරගල යොදාගෙන ඇත. මුදල් නෝට්ටුවල නිරූපිත මුරගල් රූප මඟින් මුරගලේ විකාශන අවධි හඳුනාගත හැකිය. මුරගලේ විකාශනයේ එක් අවස්ථාවක් ලෙස මුරගලට පුන්කලස එක් වූ අවස්ථාව පෙන්වා දිය හැකි අතර සෞභාග්‍ය, සශ්‍රීකත්වය, පරිපූර්ණත්වය සහ ජයග්‍රහණය සංකේතවත් කරන පුන්කලස ශ්‍රී ලාංකේය සංස්කෘතියේ මංගල සළකුණක් ලෙස වර්තමානය දක්වාම සලකනු ලබයි (වික්‍රමගමගේ, 1995, පි. 24). බෞද්ධ සාහිත්‍ය අනුව ද පුන්කලසට ප්‍රමුඛ ස්ථානයක් සම්ප්‍රදායානුගතව හිමි ව තිබුණු බැව් පෙනෙන බැවින් මුදල් නෝට්ටු සඳහා යොදාගන්නට ඇත. එසේම මුරගලින් පුන්කලස බැහැර වී එයට කුවේරගේ නිධන් රකින සංඛ සහ පද්ම නිධි රූප අතරින් පද්ම නිධි රූපය යොදාගෙන ඇත (වික්‍රමගමගේ, 1995, පි. 25). කුවේරගේ ධනය ඔහුගේ නව නිධානයන් මඟින් පෙන්නුම් කරන අතර එම ධනය පිරිහීමට පත් නොවී ඇක ගැනීමේත් යම් ස්ථානයක සෞභාග්‍යය ඇති කර ගැනීමේත් ආරක්ෂකයන් වූයේ මෙම නිධි රූපය (කුලතුංග, 2015, පි. 459). අනුරාධපුරයේ විජයබාහු රජතුමාගේ මාළිගය අභියස සංඛ, පද්ම නිධි රූප මුරගල්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වශයෙන් තබා ඇත්තේ මේ නිසා විය යුතුය (එම). දිසාපාලක රූප සහිත මුරගල වර්ෂ 2011 සහ 2013 දී නිකුත් කළ රුපියල් 1000 මුදල් නෝට්ටුවල ද නාගරාජ මුරගල වර්ෂ 2011 දී නිකුත් කළ රුපියල් 100 මුදල් නෝට්ටුවල ද දක්නට ඇත (වගුව 3). ශ්‍රී ලංකාවේ මුරගල් අතරින් කලාත්මක සහ නිමාව අතින් උසස්ම මුරගල ලෙස සැලකෙන්නේ අනුරාධපුර අභයගිරි විහාරයේ රත්නප්‍රාසාදයේ මුරගලයි (වික්‍රමගමගේ, 1995, පි. 27). මෙම නිර්මාණ බෞද්ධ සංස්කෘතියට අයත් විශිෂ්ට කලා කෘතිවීම නිසා මුදල් නෝට්ටු සඳහා ඇතුළත් කර ඇත.

සඳකඩපහණ යනු ශ්‍රී ලංකේය ශිලා කැටයම්කරුවාගේ නිර්මාණ කුසලතාව විශිෂ්ට ලෙස ප්‍රකාශ වන නිර්මාණයකි. ශ්‍රී ලාංකේය කැටයම් තාක්ෂණයේ කලාත්මක බව ලොවට කියාපාන හොඳම නිදසුනක් ලෙස සඳකඩපහණ මුදල් නෝට්ටුවලට යොදාගෙන ඇත. සඳකඩපහණ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ එය ක්‍රමික විකාශනයක ප්‍රතිපලයක් බවයි. මුල් යුගයේ දී කැටයම් රහිතව නිම වූ සඳකඩපහණ ඒ ඒ යුගලවලට අනුව විවිධ හැඩගෙන ඇති අතර එහි නිරූපිත සංකේත සහ රූප සටහන් ද වෙනස් වී ඇත (වික්‍රමගමගේ, 1995, පි. 14-17). කලා ශිල්පීන් විසින් උපරිම තත්වයට දියුණු කළ කලාත්මක සහ නිමාව අතින් විශිෂ්ට වූ සඳකඩපහණ වශයෙන් පිළිගනු ලබන්නේ අනුරාධපුර බිසෝ මාළිගයේ දක්නට ඇති සඳකඩපහණයි (වික්‍රමගමගේ, 1995, පි. 19). එම සඳකඩපහණෙහි නිරූපනයක් 1952, 1956, 1965 යන වර්ෂවල නිකුත් කළ රුපියල් 50 මුදල් නෝට්ටුවල ද වර්ෂ 1981 රුපියල් 20 මුදල් නෝට්ටුවේ ද වර්ෂ 1991 නිකුත් කළ රුපියල් 10, 50, 100, 500, සහ 1000 යන මුදල් නෝට්ටුවල ද දැකිය හැකිය (වගුව 3).

මූර්ති ශිල්පයේ විශිෂ්ටත්වය පෙන්නුම් කරන පරාක්‍රම සමුද්‍රය අසල කුඩා පර්වතයකට සම්බන්ධ කර ගලින් නෙළන ලද පුරුෂ ප්‍රතිමාව සඳහා විවිධ මත ඉදිරිපත් වී තිබුණ ද (බස්නායක, 1995, පි. 302) සාමාන්‍ය ව්‍යවහාරයට අනුව එය පරාක්‍රමබාහු ප්‍රතිමාව ලෙස සළකනු ලබයි. කලා කෘතියක් වශයෙන් මෙම ප්‍රතිමාව මුදල් නෝට්ටුවලට අන්තර්ගත කර ඇත්තේ එයින් උදාරත්වය සහ ආනුභාවසම්පන්න බව නිරූපනය කරන බැවින් විය යුතුය. එය මුදල් දෙයාකාරයකින් දැකිය හැකිය. 1952, 1956 සහ 1962 යන වර්ෂවල නිකුත් කළ රුපියල් 5 මුදල් නෝට්ටුවල ප්‍රතිමුඛයේ පරාක්‍රමබාහු ප්‍රතිමාව පූර්ණ වශයෙන් දක්වා ඇත. වර්ෂ 1965 නිකුත් කළ රුපියල් 02, 05, 10, 50, 100 යන මුදල් නෝට්ටුවල අභිමුඛයේ පරාක්‍රමබාහු ප්‍රතිමාවේ උඩුකය පමණක් නිරූපනය කර ඇති ආකාරයක් දැකිය හැකිය (වගුව 3). ඊට අමතරව පොළොන්නරු යුගයේ රාජ්‍ය කළ නිශ්ශංකමල්ල රජු විසින් නිර්මාණය කරන ලද රාජවෙශ්‍යා භුජංග මණ්ඩපයේ සිංහ රූපය වර්ෂ 1965 නිකුත් කළ රුපියල් 5 මුදල් නෝට්ටුවේ ද යාපහුවේ සිංහ රූපය වර්ෂ 1991 නිකුත් කළ රුපියල් 10 මුදල් නෝට්ටුවේ ද දැකිය හැකි ය (වගුව 3). සිංහයා, සිංහල කලාවෙහි බහුල වශයෙන් යෙදෙන මෝස්තරයකි. සිංහලයන්ගේ මිත්‍යා කතාවල ආදී පුරුෂයා ද සංකේතය ද වන්නේ සිංහයා ය (කුමාරස්වාමි, 1962, 84).


මීට අමතරව කෞතුක භාණ්ඩ ලෙස සළකනු ලබන පැරණි කැටයම් බන්දේසි සහ පැරණි කඩුමිට දැක්වෙන රූප දක්වා ඇත්තේ වර්ෂ 1991 නිකුත් කළ රුපියල් 50 මුදල් නෝට්ටුවලය. පැරණි විසිතුරු බඳුනක රූපයක් සහ සේසත් රූප දක්වා ඇත්තේ පිළිවෙළින් රුපියල් 100 සහ 2000 මුදල් නෝට්ටුවලය (වගුව 3). එම මුදල් නෝට්ටු නිකුත් කර ඇත්තේ ද වර්ෂ 1991 දී ය.

මහ බැංකුව විසින් 1950 සිට 2011 දක්වා නිකුත් කළ කාණ්ඩ 11 යටතේ නෝට්ටු 56ක් නිකුත් වී ඇත. එයට අමතරව 1998, 2009 සහ 2013 යන වසරවල අනුස්මරණ නෝට්ටු 3 ක් නිකුත් කර ඇත. ඒ අනුව මේ දක්වා නිකුත් වූ නෝට්ටු ගණන 59කි (වගුව 1). එයින් 66%ක අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති සිතුවම් කිරීම සඳහා වැඩි ඉඩක් වෙන් වී ඇත. මුදල් නෝට්ටු මත පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනය කිරීමේ දී පළමු වන වගුවට අනුව මුදල් නෝට්ටුවල අභිමුඛයේ 47.5%ක ප්‍රමාණයක පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනය කර ඇති අතර ප්‍රතිමුඛයේ මෙම නිර්මාණ දැකිය හැකිය හැක්කේ 35.5%ක ප්‍රමාණයක ය.

නෝට්ටු කාණ්ඩ 11 සහ අනුස්මරණ නෝට්ටු යටතේ නිකුත් වූ රුපියලේ සිට රුපියල් 5000 දක්වා වටිනාකම් සහිත නෝට්ටු 12හි අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ සටහන් වී ඇති පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති පූර්ණ සහ අර්ධ වශයෙන් 39%ක් සහ 19%ක් වන අතර වෙනත් නිර්මාණවල ප්‍රතිශතය 42%කි.


මුදල් නෝට්ටු කාණ්ඩ 11 සහ අනුස්මරණ මුදල් නෝට්ටු යටතේ නිකුත් වූ රුපියලේ සිට රුපියල් 5000 දක්වා වටිනාකම් සහිත මුදල් නෝට්ටු 12හි සටහන් වී ඇති පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ රුපියල් 100 වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල ය (ප්‍රස්ථාරය 1). එසේම රුපියල් 10, 50, 500 සහ 1000 යන වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල ද වැඩි ප්‍රමාණයක් සටහන් වී ඇත. නමුත් රුපියල් 1, 2, 20 සහ 200 යන වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති සහ වෙනත් රූප සටහන් සමානව යොදා ඇත. රුපියල් 2000 මුදල් නෝට්ටුව පූර්ණ වශයෙන්ම වෙන් කර ඇත්තේ පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති සඳහායි. නමුත් කිසිදු නෝට්ටුවක වෙනත් නිර්මාණ සඳහා පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනවලට වඩා වැඩි ඉඩක් ලබා දී නැති බවත් පැහැදිලි වේ (ප්‍රස්ථාරය 1).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk




ප්‍රස්ථාරය 1: මුදල් නෝට්ටු වටිනාකම අනුව පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපිත ආකාරය

එසේම නිකුත් වූ මුදල් නෝට්ටු කාණ්ඩ සහ අනුස්මරණ මුදල් නෝට්ටුවල නිරූපිත පුරාවිද්‍යා වර්ගීකරණයට අනුව කැටයම් සහ මූර්ති නිර්මාණ 44% ක් ද ආගමික වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් 23%ක් වශයෙන් ද මුදල් නෝට්ටුවල සටහන් වී ඇත (ප්‍රස්ථාරය 2). සිතුවම් සහ කෞතුක භාණ්ඩ 4%ක ප්‍රමාණයක් දක්වා ඇති අතර පුරාවිද්‍යාත්මක ස්ථාන 2%කි (ප්‍රස්ථාරය 2). එසේම ආගමික නොවන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් 1% කි (ප්‍රස්ථාරය 2). මේ අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ නිරූපිත මුදල් නෝට්ටු සඳහා යොදාගෙන ඇති නිර්මාණ අතර පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථානවල දක්නට ඇති මුරගල, සඳකඩපහණ, කොරවක්ගල ඇතුළු ද්වාර මණ්ඩප නිර්මාණ සහ ආගමික වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් වන ස්තූප, වටදාගෙය සහ ප්‍රතිමාගෘහ සඳහා වැඩි නැඹුරුවක් ලබා දී ඇති ආකාරයයි.




ප්‍රස්ථාරය 2: වර්ගීකරණයට අනුව මුදල් නෝට්ටුවල නිරූපිත පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති උරුමය
(මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය - 2019/2020)

## 6. සමාලෝචනය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1950 සිට 2011 දක්වා නිකුත් කළ කාණ්ඩ 11 යටතේ නෝට්ටු 56ක් සහ 1998, 2009 සහ 2013 යන වසරවල දී අනුස්මරණ නෝට්ටු 3 ක් ද සහිත ව නෝට්ටු 59ක් නිකුත් කර ඇත. විවිධ අගයන්ගෙන් යුත් මෙම මුදල් නෝට්ටුවල ශ්‍රී ලංකාවේ අභිමානය නිරූපනය කෙරෙන පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති සනිටුහන් වී ඇත. ඒවා ආගමික සහ ආගමික නොවන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්, සිතුවම්, කැටයම්, මූර්ති නිර්මාණ සහ කෞතුක භාණ්ඩ යනුවෙන් වර්ගීකරණය කළ හැකිය. මෙම වර්ගීකරණය අනුව කැටයම් සහ මූර්ති නිර්මාණ වැඩි නෝට්ටු ප්‍රමාණයක සටහන් කර ඇති අතර පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ රුපියල් 100 වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල ය. එමෙන්ම මුදල් නෝට්ටුවල පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති නිරූපනය කිරීමේ දී වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ මුදල් නෝට්ටුවල අභිමුඛය ය.

ජාතියක උරුමය පිළිබඳ අනන්‍යතාව ලොවට හෙළි කිරීමට සමත් උරුම අංග මුදල් නෝට්ටු තුළ නිරූපනය කිරීම මගින් ජාතික අනන්‍යතාව සහ හෙළ කලාකරුවාගේ විභව දක්ෂතා පිළිබඳ අභිමානයක් ලාංකේය ජනයාගේ සිතෙහි ජනිත කිරීම අපේක්ෂා වන්නට ඇත. එසේම ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති අභිමානවත්ව ලොවට ප්‍රකාශ කිරීමට මෙන්ම රටේ ප්‍රතිරූපය ලොවට ගෙන යා හැකි නිරූපන ලෙස මේවා මුදල් නෝට්ටුවලට අන්තර්ගත කරන්නට ඇත. පැරණි දත්ත විවිධාකාරයේ වාර්තාගතකරණ ක්‍රමවේද ඔස්සේ අනාගතය උදෙසා අරක්ෂා කිරීම සිදුවේ. එමෙන්ම ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති ද මුදල් නෝට්ටු තුළ නිරූපිතව තිබීම මගින් එක් ආකාරයකින් එම උරුමය පිළිබඳ දත්ත වාර්තාගතවීමක් සිදුවනවා මෙන් ම තවත් ආකාරයකින් උරුමය පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් මහජන ආකාර්ශනය ද ලබාගත හැකි වනවා ඇත. ජනතාව අතර ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මෙම ස්ථාන ජාතික අනන්‍යතාවයේ සංකේත ලෙස සැලකීම මේවා මුදල් නෝට්ටුවල දැක්වීමට හේතු විය හැකිය. මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ සෑම පුද්ගලයකු අතම මුදල් නෝට්ටු සංසරණය වන බැවින් ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක කලා කෘති මුදල් නෝට්ටු මත නිරූපනය කරමින් ශ්‍රී ලාංකේය අනන්‍යතාව සමාජගත කිරීමට දක්වන ලද ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

කුමාරස්වාමි, ආනන්ද, කේ. (1962). **මධ්‍ය කාලීන සිංහල කලා**. කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

කුලතුංග, ටී.ජී. (2015). **ශ්‍රී ලංකාවේ කාසි සහ මුදල් ව්‍යවහාරය**. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

ක්‍රව්දර්, ජියෝෆ්‍රි. (1965). **සංක්ෂිප්ත මුදල් විද්‍යාව**. කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, ප්‍රිශාන්ත. (1998). **සීගිරිය ආරාමික පුරාවිද්‍යාව**. කැළණිය: කර්තෘ ප්‍රකාශක.


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

පරණවිතාන, ඇස්. (1995). **ලංකාවේ ස්තූපය**. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බස්නායක, එච්.ටී. (1995). **ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 1**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1995). **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු**. කොළඹ: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය.

**සිංහල ශබ්දකෝෂය**. 2 කොටස. (ඩබ්. සෝරත ථෙර සංස්.). (1963). ගල්කිස්ස: කර්තෘ ප්‍රකාශන.

සෙනෙවිරත්න, අනුරාධ. (1966). **ලක්දිව වටදාගේ**. කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම.

සෝමදේව, රාජ්., කන්නන්ගර, පත්මසිරි., විද්‍යාලංකාර, අනුත්තරාදේවී. (2016). **ඉපැරණි ලෝක ශිෂ්ටාචාර.** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

හේරත්, විනීතා. (2016). ශ්‍රී ලංකා රුපියලේ ගමන් මග. **සටහන.** 35(1-2). කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.

**Archaeological Ordinance**, Ordinance No. 09 of 1940, Colombo: Government Printing. (Article No. 16)

Codrington, H.W. (1994) (Reprint). **Ceylon Coins and Currency.** Colombo: Government Press.

Hewitt, V. H. (1998a). Currency for a Colony: Paper Money for Ceylon Printed in England. In O. B. Weerakkody, **Origin, Evolution & Circulation of Foreign Coins in the Indian Ocean** (pp. 255-272). New Delhi: Manohar Publishers and Distributors.

Hewitt, V. H. (1998b). Rags to Riches: How paper money becomes respectable. In O. B. Weerakkody (Ed.), **Origin, Evolution & Circulation of Foreign Coins in the Indian Ocean** (pp. 91-106). New Delhi: Manohar Publishers and Distributors.

Hewitt, V. H. (1998c). Women as Symbols of wealth: Female image on Paper Money. In O. B. Weerakkody (Ed.), **Origin, Evolution & Circulation of Foreign Coins in the Indian Ocean** (pp. 91-106). New Delhi: Manohar Publishers and Distributors.

Galloy, J.M. (2007). **Symbols of Identity and Nationalism in Mexican and Central- American Currency**. Applied Semiotics, 4(9): 15–34.

Gilbert, E. & Helleiner, E. (1999). **Nation-States and Money: The Past, Present and Future of National Currencies**. London: Routledge.

Lowenthal, D. (1986). **Heritage Crusade and the Spoils of History**. New York: Cambridge University Press.

Silva, G. D. (2000). **History of Coins and Currency in Sri Lanka. (3rd Century BC to 1998 AD)**. Colombo: Central Bank of Sri Lanka.

**The Ceylon Paper Currency Ordinance**, 1884 of 10th December, 1884

**The Monetary Law Act**, No. 58 of 1949

**The New Encyclopedia Britannica** (15 ed., Vol. 3). (n.d.). USA: Chicago. Unwin, T. & Hewitt,V. (2001). Banknotes and national identity in central and eastern Europe. Political Geography 20 (2001) 1005–1028. Weiner, J. S. (Ed.). (1989).

**The Oxford English Dictionary**, 1989, 2nd Ed Vol.III J.A. Simpson and E.S.C. Weiner Oxford: Clarendon

Unwin, T. & Hewitt,V. (2001). **Banknotes and national identity in central and eastern Europe. Political Geography**. 20 (2001) 1005–1028.

Weatherford, Jack. (1997). **The History of Money**. New York: Crown Publishers.

**Webster Dictionary**, Available at: https://www.merriam-webster.com/dictionary/coins (Accessed: 10 June 2020).

Wei ner, J. S. (Ed.). (1989). **The Oxford English Dictionary** (2 ed., Vol. 3). Clarendon: Oxford.

**වෙබ් අඩවි**

**Bank Charter**, 1844 Act, https://www.legislation.gov.uk/ukpga/Vict/7-8/32/contents/enacted, (Accessed: 19 March 2023).

**Cambridge Dictionary**, Available at: https://dictionary.cambridge.org/dictionary/english/paper-currency (Accessed: 10 June 2020).

**Collins Dictionary**, Available at: https://www.collinsdictionary.com /dictionary/english/coin (Accessed: 10 June 2020).

**Heritage**, Available at: https://en.unesco.org/fieldoffice/santiago/cultura/patrimonio#:~:text=Heritage%20is%20the%20cultural%20legacy,pass%20on%20to%20future%20generations, (Accessed: 19 March 2023).

**Investopedia**, Available at: https://www.investopedia.com/terms/p/paper_money.asp (Accessed: 10 June 2020).

Lauer, J. (2008). **Money as Mass Communication: U.S. Paper Currency and The Iconography of Nationalism the Communication Review**, 11: 109–132. Available from https://www.tandfonline.com/doi/abs/10 .1080/10714420802068359 [Accessed on 2 nd September 2020].

**Lexico Oxford English and Spanish Dictionary** [Online] Available from https://www.lexico.com/definition/paper_currency. [Accessed on 31st August 2020].

Peskov, Denis. (2014). **Unesco's World Heritage Objects on National Banknotes. Ethnographic Review**, No 4, 2014. pp.156-170. Available from http://journal.iea.ras.ru/en/index.htm [Accessed on 2nd September 2020].

**The Free Dictionary** [Online] Available from https://www.thefreedictionary.com/paper+currency#:~:text=1.,as%20a%20substi tute %20 for %20specie. [Accessed on 31st August 2020].



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*